# ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු

පහත සඳහන් පුරප්පාඩුව සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් **2019.03.27** දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

**ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ**

**<u>සුදුසුකම්</u>**

01. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්∴උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් උපාධියක් හෝ ඒ හා සමාන ආයතනයකින් ලබාගත් ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපාධියක් සහ උපාධිය ලබා ගැනීමෙන් පසු එම ක්ෂේත්‍රයේ ශාරීරික අධ්‍යාපන වැඩසටහන් සංවිධානය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ වසර දහයක(10) පළපුරුද්ද තිබීම

**හෝ**

02. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්∴උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් උපාධියක් සමඟ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් හෝ අදාළ විෂය ක්ෂේත්‍රයේ වෘත්තිය සුදුසුකම් සමඟ පළමු උපාධිය ලබා ගැනීමෙන් පසුව පිළිගත් ආයතනයක ශාරීරික අධ්‍යාපන වැඩසටහන් සංවිධානය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව වසර දොළහක (12) පළපුරුද්ද තිබීම

**හෝ**

03.විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ සහකාර අධ්‍යක්ෂ තනතුරක් දැරීම සහ එම තනතුරෙහි සේවය තහවුරු වී වසර පහකට(05) නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ වී තිබීම

**තෝරා ගැනීම**

සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් **40%** ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබීම සහ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය මත තෝරාගනු ලැබේ

**වැටුප් පරිමාණය**

[U-EX 2(II)]
Rs. 66,180 - 8x 1,335: 8 x 1,630 - 89,900p.m. as at 01.01.2020

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2016/17 (V) අනුව ඉහත වැටුප් පරිමාණයන් පියවර 5කින් 2016 සිට 2020 දක්වා ක්‍රියාත්මක කරනු ලැබේ. සම්පූර්ණ වැටුප් පරිමාණය 2020 සිට බලපැවැත්වෙනු ඇත.

ඒ අනුව 2019 වර්ෂයේ ආරම්භක වැටුප් පියවර රුඃ 59,497.00ක් වේ. (මෙම වැටුපට අමතරව රජය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ)

## ප්‍රතිලාභ

තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔවුන්ගේ මාසික වැටුපෙන් 10% විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලට දායක විය යුතුය. විශ්වවිද්‍යාලය විසින් සේවකයාගේ වැටුපෙන් 15% ක දායකත්වයක් දරන අතර ඉන් 8% ක් විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලටද, 7% ක් විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලට ද දායක කරනු ලබයි. මීට අමතරව සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට විශ්වවිද්‍යාලය විසින් සේවකයාගේ වැටුපෙන් 3% ක් දායක කරනු ලැබේ.

ජ්‍යෙෂ්ඨ පරිපාලන නිළධාරීන්ට සප්තවාර්ෂික නිවාඩු සඳහා අවුරුදු 7ක සේවා කාලයකින් පසුව වසරක වැටුප් සහිත නිවාඩු හෝ වසර 2ක වැටුප් රහිත නිවාඩු සඳහා හිමිකම් ලබන අතර ඉහත නිවාඩුව තුළ විදේශගත වන නිළධාරියාට හා කලත්‍රයාට සම්පූර්ණ ගුවන් ටිකට්පත් ලබා දෙනු ලැබේ.

## අයදුම්පත් හා විස්තර

අයදුම්පත්, අවශ්‍ය සුදුසුකම් හා වෙනත් තොරතුරු විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියවන www.seu.ac.lk යන ලිපිනයෙන් ලබා ගත හැක. අයදුම්පත සමග මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක 228-1001-9000-1704 අඩ්ඩාලච්චේන යන ගිණුමට රුː 200.00 ගෙවූ එම රිසිට්පත ඇමිණිය යුතුයි.

නිසි පරිදි පුරවන ලද අයදුම්පත, සහතිකපත් වල පිටපත් සහිතව ලියාපදිංචි තැපැලෙන් Registrar, South Eastern University of Sri Lanka, University Park, Oluvil #32360 යන ලිපිනයට **2019.03.27** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. අයදුම්කරන තනතුර ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හා වෙනත් රජයේ ආයතනවල සේවය කරන අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානියා මගින් එවීම අනිවාර්ය වේ. එසේ නමුත් මූලික පිටපතක් ප්‍රථමයෙන් එවීමට හැකියාව ඇති අතර එසේ එවන ලද මූලික පිටපත් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමට සලකා බලනු නොලැබේ. අයදුම්කරු විසින් අදාළ දෙපාර්තමේන්තු හෝ සංස්ථා ප්‍රධානියා හරහා නියමිත මාර්ගයෙන් නොඑවන ලද කිසිදු අයදුම්පතක් විශ්වවිද්‍යාලය විසින් සලකා බලනු නොලැබේ.

අසම්පූර්ණ, අපැහැදිලි හා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් තෝරාගැනීමේ බලය අග්නිදිග විශ්වවිද්‍යාලය සතුය. අයදුම්පත් මගින් තෝරා ගනු ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
විශ්වවිද්‍යාල උයන
ඔලුවිල් - 32360
23.02.2019